T- 53

# සමාජ සාරධර්ම කෙරෙහි විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි
ආයතනය (කැලණිය විශ්ව විද්‍යාලය) යටතේ
දර්ශනපති උපාධි පර්යේෂණය වෙනුවෙන්
සැකසුණු පර්යේෂණ
නිබන්ධය.

එච්. අර්වින් ෆොන්සෙකා
(ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)
ශිෂ්‍ය අංකය :- 2001(M-Phil - 524)

# සාරාංශය

විභාග කේන්ද්‍රිය අධ්‍යාපනය සමාජ සාරධර්ම කෙරෙහි බලපෑම යන මාතෘකාව යටතේ කරන ලද මෙම අධ්‍යයනය මහ නගරසභා, නගරසභා, පාසල් සහ ප්‍රාදේශීයසභා සීමාවන් තුළ පිහිටියාවූ ලෙසට වර්ග කරගන්නා ලදී. අ.පො.ස. උ.පෙළ හදාරන්නාවූ සිසු සිසුවියන් වෙන් වෙන්ව කාන්තා හා පිරිමි පාසල් ලෙසට හා මිශ්‍ර පාසල් ලෙසට වර්ගකර ගන්නා ලදී. ඒ සමග ම එවැනි වර්ග කිරීමක් යටතේ පවතින පාසල්වල ගුරුභවතුන් ගෙන් ද කරුණු අනාවරණය කරගන්නා ලදී.

පහවසර ශිෂ්‍යත්ව පරීක්ෂණයට ඉදිරිපත්වන සිසුන්ගේ දෙමාපිය පිරිසකගෙන් ද කරණු අනාවරණය කරගන්නා ලදි (එක් විද්‍යාලයකින් පමණි) ගුරුභවතුන්ගෙන් කරුණු ලබාගැනීමේදී අවම වශයෙන් නගරසභාවන්, ප්‍රාදේශීයසභාවන් අයත් පහත සඳහන් දිස්ත්‍රික්කයකින් එක් පාසලක්වත් තෝරාගන්නා ලදි. මාතර, මහනුවර, හම්බන්තොට, මාතලේ, අම්පාර සිංහල මාධ්‍යයෙන්ද දෙමළ මාධ්‍ය පාසල් පිහිටි දිස්ත්‍රික්ක වන යාපනය, වව්නියාව, ත්‍රිකුණාමලය, පුත්තලම යනාදි දිස්ත්‍රික්ක වල ගුරුභවතුන් දක්වූ පරිදිත් විභාග කේන්ද්‍රිය අධ්‍යාපනයේ සම්බන්ධතාව සමාජ සාරධර්ම කෙරෙහි සෘණාත්මක සබඳතාවක් පවතින බවට ද සිංහල මාධ්‍ය පාසල් ගුරුභවතුන් අදහස් දක්වන සේ දෙමළ මාධ්‍ය ගුරුභවතුන් ද දක්වනුයේ ඒ සම්බන්ධයෙන් වැඩි සෘණාත්මක සම්බන්ධතාවයකි.

මේ අන්දමට එම පාසල්වලින් ගුරුභවතුන් ගෙන් මෙම මාතෘකාව කෙරෙහි දක්වන ආකල්පයන් අනාවරණය කරගන්නා ලදී. දෙමළ ගුරුභවතුන්ද ඒ ඒ දිස්ත්‍රික්කවලදී අවම වශයෙන් එක් ගුරුභවතකු එක් දිස්ත්‍රික්කයක් වත් නියෝජනය වන සේ කරුණු ඉදිරිපත් කරණු ලැබීය.

ගුරුභවතුන්ගේ ප්‍රශ්නාවලිය සුවිශේෂි ලෙසට සිදුකරනු ලැබූ වේ පානදුර ප්‍රදේශය තුළය. එහි නාගරික අර්ධ නාගරික හා ග්‍රාමීය ලෙසට පාසල් තෝරා ගෙන වර්ග කරගනු ලැබිණි. මේවායේ ගුරුභවතුන්ගෙන් මාතෘකාවට අදාළව ප්‍රශ්නාවලිය තුළින් දත්ත රැස්කර ගන්නා ලදි.

දරුවන්ගේ ප්‍රශ්නාවලියෙන් අවධාරණයට ලක්වූයේ බාහිර වැඩට සහභාගිත්වය, විවේකය ඔවුන් ගතකිරීම, ඥාති සබඳතා පැවැත්වීම, දහම් පාසල් යාම, පාඩම් කිරීම පාඩම් කරන කාලය යන කරුණුය. ප්‍රශ්නාවලියෙන් ඒවා අනාවරණය කරගන්නා ලදි. ගුරුභවතුන්ගෙන් සිසුන් විභාග කේන්ද්‍රියවීම පිළිබඳව කරුණුත් සමාජ සාරධර්මවලට ඒ හා සම්බන්ධතාවක් පවතීද යන කරුණුත් අනාවරණය කරගන්නා ලදි.

පහ වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයට ඉදිරිපත් වන සිසු පිරිසකගේ දෙමාපියන්ගෙන් අනාවරණය කරගනු ලැබුවේ දරුවා හා සමාජ සාරධර්ම අතර සබඳතාවත් ඒ කෙරෙහි දෙමාපියන් කුමන ආකාරයෙන් සම්බන්ධවී ඇත්දැයි යන්නය. මේ අන්දමට මාතෘකාවට අදාළව කරුණු ගොනු කරගනු ලැබීය.

පරීක්ෂණ උපකරණය සකස් කිරීමේදී සමාජ සාරධර්ම හඳුනාගෙන එය පාදක කොට ගෙන අධ්‍යාපනය හඳුනාගනිමින් අධ්‍යාපනයේ විභාග කේන්ද්‍රීය භාවය සමාජ සාරධර්ම කෙරෙහි කුමන ආකාරයේ බලපෑමක් කර ඇත්දැයි අනාවරණය කරගැනීමට හැකිවන පරිදි සකස් කර ගන්නා ලදි.

දත්ත විශ්ලේෂණයේදී ප්‍රතිශත වටිනාකම් ප්‍රමුඛව තෝරා සහ සම්බන්ධතා අනුව සකස් කරනු ලැබිණ.

නියැදියට අයත් සිසුන්ගේ සාරධර්ම පිළිබඳ දත්ත තුළින් මධ්‍යස්ථ සාරධර්ම ලක්ෂණ පෙන්නුම්කරන ලද අතර සාරධර්ම ඉහළින්ම සංවර්ධනය වූ සිසුන් දක්නට නොලැබිණි.

බොහෝ කොටම ශිෂ්‍ය ප්‍රශ්නාවලියට සම්බන්ධ වූයේ ඔවුනගේ සාරධර්ම හා විභාග කේන්ද්‍රීය සම්බන්ධතාවයි.

ඒ අනුව විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය හා සාරධර්ම අතර වඩාත්ම පවතින්නේ ඍණ සම්බන්ධතාවක් බව පෙනේ.

යථෝක්ත සිසුහු විභාග සමත්වීම හා සම්බන්ධව ඍජුවම ධන ආකල්ප දරති. එසේම ක්‍රියාත්මක අංශයේදී අනෙකුත් කාර්යයන් ගෙන් ඉවත්වී විභාග කේන්ද්‍රීය වෙමින් කටයුතු කිරීම තුළ දිස්වන්නේ ඔවුන් පවත්නා තත්ත්වයට බෙහෙවින් අනුරූපවීමක් දක්නට ලැබෙන බවයි.

ශිෂ්‍ය ආකල්ප පිළිබඳව අනාවරණයන් අනුව විෂය බාහිර කටයුතුවල හා වෙනත් සාමාජයීය කටයුතුවල යෙදීම විභාග කටයුතුවලට බාධා වන බව පෙනේ. නමුත් ඔවුන්ගෙන් ලබාගත් දත්ත පෙන්නුම් කරන්නේ ස්වයං ආකල්ප අනුව කටයුතු කිරීමක් සිදුනොකරන බවයි. එය දත්ත තුළින් සාපේක්ෂව අඩු ප්‍රතිශතයක් පෙන්වා ඇත. උක්ත කාර්යයන්හි යෙදුනේ ද වැඩිකාලයක් ම විභාග අවධාරණය කරන කටයුතුවලද යෙදෙන බැව් කරුණු තුළින් පෙනේ.

නාගරික පාසල් ග්‍රාමීය පාසල් වලට වඩා සාරධර්ම සංවර්ධනය සම්බන්ධයේන් ඍණාත්මක භාවයක් පෙන්නුම් කරනු ලැබීය.

පිරිමි පාසල්වල බාලිකා පාසල්වලට වඩා විභාග අවධාරණය සම්බන්ධයෙන් සමාජ සාරධර්ම කෙරෙහි ඍණාත්මක සම්බන්ධතාවක් පැවතුණු බවක් පෙනේ.

උපාධි ගුරු පිරිසක් හා පුහුණු ගුරු පිරිසක් දැක්වූ අදහස් සංසන්දනය තුළින්ද පුහුණු ගුරුපිරිස් ශිෂ්‍යයින්ගේ විභාග කේන්ද්‍රීය භාවය සාරධර්ම කෙරෙහි ඍජුලෙස සම්බන්ධතාවක් පවතින බවක් දක්වා ඇත.

මිශ්‍ර පාසල් හා අමිශ්‍ර (පිරිමි) පාසල්වල ගුරුභවතුන් ප්‍රශ්නාවලියට දුන් පිළිතුරු අනුව මිශ්‍ර පාසල්වල අමිශ්‍ර (පිරිමි) පාසල්වලට වඩා සාරධර්ම කෙරේ නැඹුරුතාවක් පවතින බවක් පෙනෙන බව අනාවරණය විය.

විභාග අවධාරණය කරන ලද තත්ත්වයෙන් ඉහළ තනතුරුවලට පැමිණි පුද්ගලයින් හා සාරධර්ම අතර සබඳතාව සොයා දැනගන්නා ලදි එහිදි ඔවුන්ගේ සාරධර්ම ඍණාත්මක වශයෙන් දක්නට ලැබිණි.

අධ්‍යාපනය හා ඉගෙනුම අතර පවත්නා වෙනස හඳුනාගනු ලැබූ අතර සාරධර්ම පිරිහීමටත් මිනිමරුවන්, ස්ත්‍රී දුෂකයින්, සොරුන් හා මත්කුඩුවලට ඇබ්බැහිවූවන් තුළ නිවැරදි අධ්‍යාපනයක් නොමැති වීමක්ද පසක් කර ගන්නා ලදි. එහිදි ඔවුන් පසුකරගෙන පැමිණියේ ඉගෙනිමක් විනා අධ්‍යාපනයක් නොලැබූ බව ඔවුන් සමග සාකච්ඡා කර ගනු ලැබීමෙන් දැන ගනු ලැබීය. ඉගෙනුමක් (විභාග අවධාරණයවූ අධ්‍යාපනයක්) තුළින් මේ අන්දමට සාරධර්ම පිරිහියාමක් සිදුවන බවත් සිර කරුවන් හා සාරධර්ම අතර සබඳතාව ශූන්‍ය බවත්, එය නැවත (ධනාත්මකව) සංවර්ධනය කළ හැකි බවත් සිරගෙය බුදුගෙයක් බවට පත්කළ හැකි බවත් (සමාධි සඟරාව) අනාවරණය කරගනු ලැබිණි.

කාන්තාව මැද පෙරදිග යාම හා සාරධර්ම සමග පවතින්නේ ඍණාත්මක සබඳතාවක් ලෙසට පෙන්වා දෙනු ලැබිය හැකි විණි. නිවැරදි අධ්‍යාපනයක් නොලබා මැද පෙරදිග යාම නිසා සාරධර්ම අතර පවත්නා ඍණාත්මක සබඳතාව වැඩිපුරම සිදුවන බවත් පෙනේ. එසේම මැද පෙරදිග ගිය කාන්තාවට හිමි ස්වාමියන් සතු අධ්‍යාපනය මදවීම (විභාග කේන්ද්‍රිය අධ්‍යාපනයක් පැවතීම) නිසා සාරධර්මවලින් ඉවත්ව යන අන්දමද එහිද දැකගන්නට ලැබිණි. එහිදී ඍණාත්මක සබඳතාව මැනවින් ඉස්මතුවී පැවතුණි.

රියදුරන් කෙරෙහි පවතින අධ්‍යාපනයේ හා සාරධර්ම අතර පවතින සබඳතාව ධනාත්මකව දැකිය හැකි අතර එම අධ්‍යාපනය ඉගෙනුමක් සේ සැළකුවහොත් ඉන් සාරධර්ම අතර ඍණ සබඳතාවක් ඇති වේ. මෙම ඍණ සබඳතාව නිසා රිය අනතුරු වැඩි වී ඇති බවක් මෙයින් පෙන්නුම් කළ හැකිවිණි.

එදා ඉගෙනුම අඩු කාලයක (අධ්‍යාපනයෙන් පිරිපුන්) සම්ප්‍රදායික ගම්මාන තුළ සාරධර්ම පැවතියේද මෙකල ඉගෙනුම වැඩි කාලයක (විභාග කේන්ද්‍රිය අධ්‍යාපනයෙන් පිරුණු) විශ්ව ගම්මාන තුළ  සාරධර්ම පැවතීම ඍණාත්මක වැඩිවීමක් රොබට් නොක්ස් පදිංචි වූ ගම්මාන තුළ සංචාරය කිරීම තුළින් අනාවරණය කරගතිමි.